සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2016
இரண்டாம் தவணைப் பரீட்சை 2016
Second Term Test 2016

6 ශ්‍රේණිය
தரம் 6
Grade 6

ගණිතය
கணிதம்
Mathematics

පැය දෙකයි.
இரண்டு மணித்தியாலம்
Two Hours

Mathematics.lk

නම/ විභාග අංකය : ........................................................................ පන්තිය : ........................

I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(1) 7 හි මුල් ගුණාකාර හතර ලියන්න.

(2) 100 ට වැඩි කුඩාම ඉරට්ටේ සංඛ්‍යාව කුමක්ද?

(3) සුළු කරන්න

```
 500
-284
----
====
```

Mathematics.lk

(4) තලයක සිරස් බව දැන ගැනීමට භාවිත කරන උපකරණය කුමක් ද?

(5) හතරවන ත්‍රිකෝණ සංඛ්‍යාව කුමක් ද?

(6) ප.ව. 2.00 සම්මත ක්‍රමයට අනුව ලියන්න

(7) එක් පන්තියක සිසුන් 36ක් ද අනෙක් පන්තියේ සිසුන් 39 ක් ද සිටිති. පන්ති 2හි සිටින මුළු සිසුන් ගණන සොයන්න

(8) 3 , 5 , 7 , 9 , 11 යන සංඛ්‍යා වල ඇති පොදු ලක්ෂණය කුමක්ද?

(9) හිස්තැන් පුරවන්න.

i) පැය 48 = දින ..............

ii) මිනිත්තු ........... = තත්පර 180

(10)



මෙම මෝස්තරයේ ඇති වෘත්ත ගණන කීයද?

(11) 128308154 මෙම සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියන්න.

(12)



මෙම පොතේ අඳුරු කර දක්වා ඇති කොටසේ පිටු 50 තිබේනම් සම්පූර්ණ පොතේ ඇති පිටු ගණන නිමානය කරන්න?

Mathematics.lk

(13) >, < හෝ = යන සංකේත ඇසුරින් පහත හිස් තැනට ගැලපෙන සංකේතය යොදන්න

$\frac{2}{5}$ ........ $\frac{2}{3}$

(14) පහත රූපයේ පාදයක් හා කෝණයක් ලකුණු කරන්න



(15) හිස්තැන් පුරවන්න.

5 cm 7 mm = 5 cm + ……mm

= …..mm + ……mm

=……… mm

Mathematics.lk

(16) පහත දැක්වෙන ගණක රාමුවෙන් නිරූපණය කෙරෙන සංඛ්‍යාව ලියන්න




(17) "සෘණ හතර, දෙකට වඩා කුඩා වේ." මෙම වගන්තිය අසමානතා භාවිත කර ලියන්න.

(18) හිස්තැන් පුරවන්න.

i) සරල රේඛා ඛණ්ඩ. ....... ක් හමුවීමෙන් කෝණයක් සෑදේ.

ii) සෘජුකෝණී මුල්ලක් ලබා ගැනීමට කඩදාසියක් නැමිය යුතු වාර ගණන. ....... කි.

(19) උතුරු දිශාවත් නිරිත දිශාවත් අතර රූපයේ දක්වා ඇති ආකාරයට කෝණ වර්ගය දක්ෂිණාවර්තව සෑදෙන්නේ කමන වර්ගයේ කෝණයක් ද?




Mathematics.lk

(20) මෙම සරල රේඛා ඛණ්ඩයේ දිග මැන ලියන්න

**(02 X 20 = 40)**

Mathematics.lk

## II කොටස

(ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්ණයකට ම ලකුණු 12 බැගින් ලැබේ.)

**(01)** a) වෙළඳ සැලක ප්‍රදර්ශනය කර ඇති මිළ ගණන් සහිත පුවරුවක් පහත දැක්වේ.

| ද්‍රව්‍ය | මිල |
|---|---|
| සම්බා හාල්1kg | රු 90.00 |
| සීනි1kg | රු 110.00 |
| මයිසූර් පරිප්පු1kg | රු 180.00 |
| තේ කොළ1kg | රු 600.00 |
| ඇන්කර් කිරි පැකට් 1 | රු 325.00 |

i. සම්බා සහල් 2kg මිල සොයන්න.

ii. සම්බා හාල් 2kg ක් හා තේ කොල 100g ක් මිලදී ගත් අයෙකු ගෙවිය යුතු මුළු මුදල සොයන්න.

b) i. හිස්තැන් පුරවමින් $\frac{1}{3}$ ට තුල්‍ය භාග 2ක් ලියන්න.

අ) $\frac{1}{3} = \frac{1\times4}{3\times4} = \frac{4}{\square}$ අ) $\frac{1}{3} = \frac{5}{\square}$

ii. සුළු කරන්න.

$$\frac{1}{3} + \frac{2}{15} =$$

c) i. $\frac{25}{100}$ මෙම භාගය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

ii. එය කියවන ආකාරය වචනයෙන් ලියන්න.

iii. සුළු කරන්න

$$\begin{array}{r} 2.53 \\ \underline{9.64}\ + \\ \underline{\underline{\phantom{9.64}}} \end{array}$$

Mathematics.lk

**(02)** 45 604 768 983

i. ඉහත සංඛ්‍යාව කියවන ආකාරය වචනයෙන් ලියන්න.

ii. මෙහි 8 න් නිරූපණය වන අගයන් ලියන්න.

iii. ඉහත ii කොටසෙහි ලැබුණු අගයන් අතරින් විශාල සංඛ්‍යාවේ අගය කුඩා සංඛ්‍යාවේ අගය මෙන් කී ගුණයක්ද?

iv. දී ඇති සංඛ්‍යාවේ දහස් කලාපය ලිවීමට භාවිත කර ඇති ඉලක්කම් මොනවාද?

v. එම ඉලක්කම් එක්වරක් පමණක් භාවිත කරමින් ලිවිය හැකි විශාල ම සංඛ්‍යාව ලියන්න.

vi. ඔබට පිළිතුර ලෙස ලැබුණ සංඛ්‍යාවේ අග ඉලක්කම් දෙකෙන් දැක්වෙන සංඛ්‍යව ආසන්න 10 ට වටයා ලියන්න.

**(03)** (a) i. 12 සාධක යුගලවල ගුණිත ලෙස දක්වමින් හිස්තැන් සම්පූර්ණ කරන්න.




ii. 12 හි සාධක සියල්ල ම ලියන්න.

iii. 2 හා 5 යන ඉලක්කම් දෙකෙන් ම ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා දෙකක් ලියන්න.

b) i. 1 සිට 15 තෙක් ඇති සංඛ්‍යා සියල්ල ම ලියන්න.

ii. එම සංඛ්‍යා අතරේ ඇති ඉරට්ට සංඛ්‍යා වටා රවුම් අඳින්න

iii. එහි ඇති ප්‍රථමක සංඛ්‍යා වටා කොටු අඳින්න.

iv. එම සංඛ්‍යා අතරින් ප්‍රථමක සංඛ්‍යාවක් වන ඉරට්ට සංඛ්‍යාව කුමක්ද?

**(04)** a) i. නිමාලිගේ පියා රැකියාව සඳහා පෙ.ව. 7.45 ට නිවසින් පිටත් ව නැවත ප.ව. 5.30 ට නිවසට පැමිණියේය. ඔහු නිවසින් පිටත ගත කළ කාලය සොයන්න. (

ii. සුළු කරන්න.

| | දින | පැය |
|---|---|---|
| | 5 | 13 |
| + | 6 | 18 |
| | | |

| | පැය | මිනිත්තු |
|---|---|---|
| | 18 | 20 |
| - | 6 | 34 |
| | | |

Mathematics.lk
FOR FUTURE EDUCATION IN SRI LANKA

b) කුසල්ට තම නිවස අසල පිහිටි කඩයට යාමට නිවසින් 50 m ක් උතුරු දිශාවට ගොස් නැවත 20 m ක් ගිණිකොණ දිශාවට ගමන් කල යුතු නම් මෙම තොරතුරු දළ රූප සටහනක දක්වන්න.

c) තිරස් තලයක තබා ඇති ගඩොල් කැටයක් රූපයේ දැක් වේ.

i. මෙහි තිරස් තල කීයක් තිබේද?

ii. රූපයේ සිරස් දාරයක් ලකුණු කරන්න.



**(05)** (a) පහත දී ඇත්තේ සංඛ්‍යා රේඛාවක කොටසකි.




i. ඉහත රේඛාව මත 0, -3, 2 හා -2, යන නිඛිල ලකුණු කරන්න.

ii. එම නිඛිල ආරෝහණ පිළිවෙලට ලියන්න.

b) A සිට B ට දුර 2 m 35 cmවේ. B සිට C ට දුර 5m 70cmකි.




i. A සිට B හරහා C වෙත ගමන් කරන ළමයෙක් ගමන් කරන මුළු දුර සොයන්න.

ii. B සිට C තෙක් දුර, A සිට B දක්වා දුරට වඩා කොපමණ වැඩි ද?

c) සෘජුකෝණාස්‍රයක පළල 18cm කි එහි දිග, පළලට වඩා 2cm කින් වැඩිය.

i. දළ රූප සටහනක් ඇඳ, දී ඇති දත්ත ලකුණු කරන්න.

ii. සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න.

**(06)** (a) i.වෘත්තයක් අඳින්න.

ii. වෘත්තය මත පිහිටි ලක්ෂ්‍යයක් × ලකුණින් ද වෘත්තය ඇතුළත පිහිටි ලක්ෂ්‍යයක් ● ලකුණින් ද වෘත්තයට පිටතින් පිහිටි ලක්ෂ්‍යයක් √ ලකුණින්ද දක්වන්න.

b)




ඉංග්‍රීසි හෝඩියේ ඇති A හා L අකුරු සම්බන්ධ කිරීමෙන් සෑදුණු රූපයක් මෙහි දැක්වෙයි. එම රූපය ඇසුරින් හිස්තැන් පුරවන්න.

i. අංක 6 න් දැක්වෙන්නේ ...................... කෝණයකි.

ii. අංක 1, .......... හා ............ මගින් සුළු කෝණ දැක්වෙයි.

iii. අංක 7 න් .................... කෝණයක් දැක්වෙයි

iv. මහා කෝණ දැක්වෙන්නේ අංක.......... හා ............ මගිනි.

v. අංක 8 න් දැක්වෙන්නේ ...................... කෝණයකි.

**(07) a)**




i. ඉහත සඳහන් සතුන්, ඔවුන්ගේ පොදු ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කරන්න.

ii. ඒ එක් එක් කාණ්ඩයට සුදුසු නම් දෙකක් යෝජනා කරන්න.

b) i. සංවෘත රූපයක් හා විවෘත රූපයක් අඳින්න.

ii. පහත නම් වලට ගැලපෙන රූපය යා කරන්න.

සෘජුකෝණාස්‍රය

සමචතුරස්‍රය

ත්‍රපීසියම

රොම්බසය



***

Mathematics.lk

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව**

**දෙවන වාර පරීක්ෂණය 2016**

**6 ශ්‍රේණිය**

**ගණිතය**

**ලකුණු දීමේ පටිපාටිය**

I කොටස

| ප්‍රශ්නඅංකය | | | විස්තරය | ලකුණු | | | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| 01 | | | 7,14,21,28 | 02 | | | |
| 02 | | | 102 | 02 | | | |
| 03 | | | 216 | 02 | | | |
| 04 | | | ලම්බය | 02 | | | |
| 05 | | | 10 | 02 | | | |
| 06 | | | 14:00 | 02 | | | |
| 07 | | | 36 + 39 = 75 | 02 | | | |
| 08 | | | 2 න් බෙදූ විට එකක් ඉතිරිවීම | 02 | | | |
| 09 | | | i. 2<br>ii. 3 | 01<br>01 | | | |
| 10 | | | 5 | 02 | | | |
| 11 | | | 128 308 154 | 02 | | | |
| 12 | | | 50 × 4<br>=200 | 01<br>01 | | | |
| 13 | | | < | 02 | | | |
| 14 | | | පාදය සඳහා<br>කෝණය සඳහා | 01<br>01 | | | |
| 15 | | | 5 cm 7 mm = 5 cm + 7 mm<br>= 50 mm + 7 mm<br>=57 mm | 02 | | | |
| 16 | | | 4.06 | 02 | | | |
| 17 | | | -4 < 2 | 02 | | | |
| 18 | | | i 2<br>ii 2 | 01<br>01 | | | |
| 19 | | | පරාවර්තන කෝණයක් | 02 | | | |
| 20 | | | 6 cm | 02 | | | |

Mathematics.lk
FOR FUTURE EDUCATION IN SRI LANKA

II කොටස

| ප්‍රශ්න අංකය | | | විස්තරය | ලකුණු | | වෙනත් |
|---|---|---|---|---|---|---|
| (01) | a) | i) | රු 90× 2<br>= රු 180 | 01<br>01 | | |
| | | ii) | රු 180 + රු 60<br>= රු 240 | 02<br>01 | | |
| | b) | i) | අ 12<br>ආ 15 | 02 | | |
| | | ii) | $\frac{5}{15}+\frac{2}{15}=$<br>$\frac{7}{15}$ | 01<br>01 | | |
| | c) | i) | 0.25 | 01 | | |
| | | ii) | බින්දුවයි දශම දෙකයි පහ | 01 | | |
| | | iii) | 12.17 | 01 | 12 | |
| (02) | | i) | හතලිස් පස් බිලියන හයසිය හතර මිලියන හත්සිය හැට අට දහස් නවසිය අසූ තුන | 02 | | |
| | | ii) | 8000හා 80 | 02 | | 80 හා 8000<br>එකකට ලකුණු 1 බැගින් |
| | | iii) | $\frac{8000}{80}=100$ | 02 | | බෙදීමට 1<br>පිළිතුරට 1 |
| | | iv) | 7,6,8 | 02 | | ඉලක්කම් 3 ම තිබිය යුතුය |
| | | v) | 876 Mathematics.lk | 02 | | |
| | | vi) | 80 | 02 | 12 | |
| (03) | a) | i) | 2 × 6<br>3 ×4 | 01<br>01 | | |
| | | ii) | 1,2,3,4,6,12 | 02 | | |
| | | iii) | 10 හි ගුණාකාර 2 ක් සඳහා | 02 | | |
| | b) | i) | 1,2,3,4,5,6,7,8,9,10,11,12,13,14,15 | 01 | | ඉලක්කම් 15 ම තිබිය යුතුය |
| | | ii) | 2,4,6,8,10,12,14 යන සංඛ්‍යා වටා රවුම් ඇඳීම | 02 | | ඉලක්කම් 4 ලකුණු 1 |
| | | iii) | 2,3,5,7,11,13 යන සංඛ්‍යා වටා කොටු ඇඳීම | 02 | | |
| | | iv) | 2 | 01 | 12 | |
| (04) | a) | i) | = 17:30 - 07:45<br>= පැය 9 මි 45 | 01<br>01 | | |
| | | ii) | දින පැය<br>12 07<br>පැය මිනිත්තු<br>8 55 | 02<br>02 | | 17:30 ගැනීමට 1 යි |
| | b) | i) |  | 04 | | නිවැරදි දිශා 2ට - 02<br>දිග ලිවීමට - 02 |
| | c) | i) | 2 | 01 | | |
| | | ii) | ඕනෑ ම සිරස් දාරයක් සඳහා | 01 | 12 | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (05) | a) | i) |  | | 02 | | |
| | | ii) | -3,-2, 0,2 | | 02 | | |
| | b) | i) | 2m 35cm + 5m 70cm<br>= 8m 05cm | | 01<br>01 | | |
| | | ii) | 5m 70cm – 2m 35cm<br>3m 35cm | | 01<br>01 | | |
| | c) | i) | =18cm =18+2 = 20 cm<br> | | 02 | | දිග ලබා ගැනීමට- 01<br>රූපයේ 18cm, 20cm ලකුණු කිරීමට- 01 |
| | | ii) | (20 X 2) + (18 X 2)<br>=76 cm | | 01<br>01 | 12 | |
| (06) | a) | i) | ඕනෑ ම වෘත්තයක් | | 02 | | |
| | | ii) |  | | 03 | | අවස්ථා 3 ට 1 බැගින් |
| | b) | i) | ඍජු | | 01 | | |
| | | ii) | 3 හා 4 | | 02 | | |
| | | iii) | පරාවර්ත | | 01 | | |
| | | iv) | 2 හා 5 | | 02 | | |
| | | v) | සරල | | 01 | 12 | |
| (07) | a) | i) |  | | 04 | | එක්කාණ්ඩයකට ලකුණු 2 බැගින් |
| | | ii) | ශාක භක්ෂක සතුන්<br>මාංශ භක්ෂක සතුන් | | 01<br>01 | | |
| | b) | i) | ගැලපෙන රූපය දෙකට | | 02 | | |
| | | ii) | ගැලපෙන රූපයට යා කිරීමට | | 04 | 12 | |
| | | | | | | | |

Mathematics.lk